122804
II
300/2

# අනුරාධපුර යුගයේ ආරාම අධ්‍යාපනය

---

1. අනුරාධපුර යුගයේ ආරාම අධ්‍යාපනය පිළිබඳ ඓතිහාසික පසුබිම
2. අනුරාධපුර යුගයේ ආරාම අධ්‍යාපනය
3. අනුරාධපුර යුගයේ ආරාම අධ්‍යාපනය සහ විදේශීය සම්බන්ධතා
4. නිගමනය
5. ආශ්‍රිත ග්‍රන්ථ

CR
ලංකා ශාලාව
378.2

122804

# හැඳින්වීම.

"අනුරාධපුර යුගයේ ආරාම අධ්‍යාපනය" ශ්‍රී ලංකා විද්‍යොදය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති පරීක්ෂණය සඳහා මා විසින් ඉදිරිපත් කරනු ලබන නිබන්ධනයයි. ආරාම අධ්‍යාපන හැර 'බ්‍රාහ්මණ - ගුරු ගෙදර' වැනි වෙනත් අධ්‍යාපන ක්‍රමද අනුරාධපුර යුගයෙහි පැවති බව පෙනේ. අනුරාධපුර යුගයේ ගිහි ගුරු ගෝලයන් අතර පැවතුණු කාර්මික අධ්‍යාපනය, ශුධශිල්ප පුහුණුව, වෛද්‍ය හා නැකත් විෂයයන් ඉගෙනීම වැනි අධ්‍යාපන ක්ෂේත්‍රයේ නොයෙක් අංග අංශ පිළිබඳ ස්වල්ප වශයෙන් කරුණු පැරණි මූලාශ්‍රයන්ගෙන් හෙළිවෙයි. එහෙත් මා විසින් ඉදිරිපත් කරනුලබන මෙම නිබන්ධනයෙහි ආරාම අධ්‍යාපනය හැර අනෙක් අංශ පිළිබඳ කරුණු සොයා බැලීමක් සිදු නොකෙරේ.

මෙම නිබන්ධනය සැපයීමේදී ත්‍රිපිටකය, අටුවා, වංශකතා, විදේශිකයන්ගේ වාර්තා හා සෙල්ලිපි වැනි මූලික මූලාශ්‍රයන්ගෙන්ම කරුණු ලබා ගැනීමට උත්සාහ ගත්තෙමි. ත්‍රිපිටක පොත්පත්වලින් හෙළිවන කරුණු ලංකාවේ ආරාම අධ්‍යාපනය පිළිබඳව ද සාධාරණ බව අටුවාවල විස්තරවලින් පැහැදිලිවෙයි. නිදසුනක් වශයෙන් ලංකාවේ ආරාමවල විසූ ගුරු ගෝලයන්ගේ සම්බන්ධතා හැඩගැසුනේ විනයපිටකයේ දක්වා ඇති නීති රීතිවලට අනුව යැයි ඉදිරිපත් කළ හැක.

මෙම නිබන්ධනය සැපයීමේදී උපදේශකවරයා වශයෙන් මගපෙන්වූ ශ්‍රී ලංකා විද්‍යොදය විශ්ව විද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ කථිකාචාර්ය කරුණාරත්න විජේතුංග මහතාට (එම්.ඒ.පී.එච්.ඩී.) [illegible] තාවය ගෞරවයෙන් පළකරමි.

මෙයට,

වික්‍රමනායක අබේසිංහ,
ඉතිහාස අංශය,
ශ්‍රී ලංකා විද්‍යොදය විශ්වවිද්‍යාලය,
ගංගොඩවිල,
නුගේගොඩ.

## අනුරාධපුර යුගයේ ආරාම අධ්‍යාපනය
## පිළිබඳ ඓතිහාසික පසුබිම

ධර්මාශෝක රජතුමාගේ දහඅටවෙනි රාජ්‍ය වර්ෂයේදී හෙවත් බුද්ධ පරිනිර්වාණයෙන් අවුරුදු දෙසියතිස්හයවැන්නේ පොසොන්පුර පසළොස්වකදී මහින්දාචාර්යයන් වහන්සේ ඇතුළු ධර්මදූතයන්වහන්සේලා ලංකාවට බුදුසසුන ගෙනාවෝය.[1] මෙම ධර්මදූතයන් වහන්සේලා යටතේ භික්ෂු ශාසනය පිහිටුවීමත් ආරාම ගොඩනැගීමත් සමග ලංකාවේ ආරාම අධ්‍යාපන ක්‍රමය ආරම්භවුනි. මෙකල විශාල පිරිසක් පැවිදිව ධර්මදූතයන් යටතේ ඉගෙනීම ලැබූහ. දෙවනපෑතිස් රජුගේ බෑනාවූ මහාරිට්ඨ මහාමාත්‍ය තෙමේ සොහොයුරන් පස්පනස් දෙනෙකු සමග පැවිදිවූයේය.[2] මත්තාභය කුමාරයා පුරුෂයන් දහසක් දෙනා සමග පැවිදිවූයේය. චේතාරි, ද්වාරමණ්ඩල, ගල්ලකපීඨ, උපතිස්ස යන ගම්වලින් ද පන්සියය බැගින් පැවිදි වූහ.[3] ඉසුරුවංශිකයන් සහ වෛශ්‍ය වංශිකයන් ද පන්සියය බැගින් පැවිදි වූහ.[4] මෙසේ එකල බුදුසස්නේ පැවිදි වූ භික්ෂූහු තිස්දහසක්වූහයි මහාවංශයේ සඳහන් වෙයි. මෙම ලාංකික භික්ෂූන්වහන්සේලා ධර්මදූතයන් යටතේ ඉගෙනීම ලැබූ ප්‍රථම ශිෂ්‍ය පරපුර හැටියට සැලකියහැක. මේ කාලය තුළ මහාවිහාරය, චේතියගිරිය, ථූපාරාමය ඉසුරුමුනිය වෙස්සගිරිය, නාගදිවයින, දඹකොලවෙහෙර තිස්සමහාවිහාරය, පාචීනාරාමය යන ආරාමයන්ද ගොඩනගනලදී. හැම ආරාමයක්ම අධ්‍යාපනික ආයතනයක් වියැයි කිව නොහැකි නමුත් මෙකල ගොඩනැඟුණු ආරාම ඇසුරුකරගෙන ආරාම අධ්‍යාපන ක්‍රමය ආරම්භ වූ බව තීරණය කළයුතු වෙයි. මෙකල ගොඩනැඟුණු මහාවිහාරය මුල සිටම ලංකාවේ ආරාම අධ්‍යාපනයේ මධ්‍යස්ථානය විය.

---

1. දීපවංසො - පරි.12 ගා.38-40
2. මහාවංසො - පරි.16 ගා.10-11 (පො.බුද්ධදත්ත හිමියන්ගේ සංස්කරණය)
3. මහාවංසො - පරි.17 ගා.57-60
4. මහාවංසො - පරි.20 ගා.14-15

දෙවනපෑතිස් සමය තුළදීම සංඝමිත්තා තෙරණිය ඇතුළු මෙහෙණින් වහන්සේලා එකොළොස් නමක් වැඩම කොට ලංකාවේ භික්ෂුණී ශාසනය පිහිටුවීමෙන් ලාංකික කාන්තාවන්ගේ අධ්‍යාපනයට ද ඉමහත් සේවයක් සිදුවිය. ඒ සමගම හෝධනාගුණු උපාසිකාරාමය වැනි භික්ෂුණී ආරාම මෙරට කාන්තාවන්ගේ ආගමික මෙන්ම අධ්‍යාපනික ආයතන බවට පත්විය.[5] "ශ්‍රී සඩමි–යාගේ වීරයඩිය කැමතියෝ වූ ඒ සියළු තෙරණිහු අනුරාධපුර මහාවිහාරයෙහි විනය ග්‍රන්ථ පසද අභිධර්මයේ සත්‍යප්‍රකරණයන් ද ඉගැන්වූහයි දීපවංශයේ සඳහන් වෙයි.[6]

ආර්ය ජනාවාසයක් වූ තැන් සිට ලංකාවේ අධ්‍යාපනික ඉතිහාසය ගත්විට ආරාම අධ්‍යාපන ක්‍රමය ආරම්භ වූ දෙවනපෑතිස් සමය එක්තරා කඩඉමක් වශයෙන් සැලකීමට පුලුවන. බුදුසසුන ගෙන ඒමට පෙර ලංකාවේ නොයෙක් ආගමික භක්තිමතුන් වාසය කළ බවත් ඔවුන් ස්වකීය ආගම්වලට අයත් අනුගාමිකයන්ට ඒ ඒ පිළිගත් ධර්මයන් උගන්වන්නට ඇති බවත්සිතිය හැක. ප්‍රාග් බෞද්ධ ලංකාවේ බ්‍රාහ්මණ ගුරුගෘහ අධ්‍යාපන ක්‍රමය ද පැවතුණි. පණ්ඩුකාභය කුමාරයා ශිල්ප ශාස්ත්‍ර ඉගෙන ගත්තේ ත්‍රිවේදය පරතෙරට පැමිණි පණ්ඩුල බ්‍රාහ්මණයාගේ ගෙදර නේවාසික ශිෂ්‍යයෙකු වශයෙනි.[7] බ්‍රාහ්මණ ගුරුගෘහ අධ්‍යාපන ක්‍රමයෙහි කුල භේදය බලපවත්වන්නට ඇතැයි සිතේ. ප්‍රාග් බෞද්ධ ලංකාවේ සමාජය තුළ කුළ ක්‍රමය පැවතීමත්[8] බමුණු අධ්‍යාපනය කුල ක්‍රමය පදනම්කරගත් බවත් මෙහිදී සඳහන් කළ යුතුය. බුදු දහමේ ඉගැන්වීම් දෙස බලන විට දෙවනපෑතිස් සමයෙහි කුලභේදය හෝ ස්ත්‍රී පුරුෂ භේදය හෝ නොසැලකූ අධ්‍යාපන ක්‍රමයක් භික්ෂු භික්ෂුණී ආරාමවල ඇතිවිය. අගාරික ජීවිතයට සම්බන්ධව පැවති බමුණු ගුරු ගෙදර පුළුල් අධ්‍යාපනික ආයතනයක් බවට වර්ධනය වීමට හිතකර පරිසරයක් නොපැවතුණි. එහෙත් අනගාරික ජීවිතයක් පැවතුණු බෞද්ධ ආරාම විශාල අධ්‍යාපනික ආයතන බවට පත්වීමට හිතකර පරිසරයක පැවතුණි. වේද සාහිත්‍යය බමුණන් උගන්වන ලද්දේ සංස්කෘත භාෂා මාධ්‍යයෙනි. ප්‍රාග් බෞද්ධ ලංකාවේ පැවතුණු බ්‍රාහ්මණ ගුරුගෘහ අධ්‍යාපන ක්‍රමයට අනුව ශිෂ්‍යයන් වේදය පිළිබඳ ඉගෙනීම සංස්කෘත භාෂා මාධ්‍යයෙන් ලබන්නට ඇත.

---

5. මහාවංසො පරි. 19
6. දීපවංසො පරි. 18 ගා.14 – සද්ධම්මඩ්ඪි තිකාමයො / අනුරාධම්හයෙ පුරෙ / විනයෙ පඤ්ච වාචෙසුං / සත්තපකරණානි ච
7. මහාවංසො පරි.10 ගා.18,23
8. මහාවංසො පරි.11 ගා.91 – 94

එහෙත් දෙවනපෑතිස් සමයේ පිහිටුවන ලද ආරාමවල ධර්මය ඉගැන්වීමේ මාධ්‍යය කරගත්තේ එම ධර්මයේ පැවතුණු මාගධිය නොව දිවයිනේ ව්‍යවහාරභාෂාවයි. මිහිඳු තෙරුන් දීප භාෂාවෙන් ධර්මදේශනා කළ බව මහාවංශයේ සඳහන්වේ.[9] පෙළදහම ඉගෙනීමට අවශ්‍යකරන මාගධී භාෂාවෙන් පැවතුණු අර්ථකථාවන් හෙළ භාෂාවට නගනලදී. මහාඅට්ඨකථා, කුරුන්දිඅට්ඨකථා, මහාපච්චරි අට්ඨකථා නම් වූ සිංහල අට්ඨකථා තුනක් ගැන බුද්ධඝෝෂ සඳහන්කරයි.[10] "මගධ බසින් වැටෙමින් ආ බුදුහැලි අටුවා අපුරෙ හෙළ බසින් තැබූය"යි ධම්පියාඅටුවාගැටපදයෙහි සඳහන්වෙයි.[11] මේ ගැන චුල්ලවග්ගයේ දැක්වෙන මතයක් සඳහන් කළ යුතුය.[12] බ්‍රාහ්මණ ජාතික යමෙළු, තෙකුල දෙනම බුදුන්වෙත පැමිණ මෙසේ පැවසූහ. "ස්වාමීනි නා නා නම් ඇති නා නා ගෝත්‍ර ඇති නා නා කුලවලින් පැවිදිවූවෝ දැන් බුද්ධවචනය සකාය නිරුක්තියෙන් දූෂණය කරති. එබැවින් ස්වාමීනි අපි බුද්ධවචනය ඡන්දසට(වෛදිකභාෂාවට) නගන්නෙමු!" එහිදී බුදුන් මේ භික්ෂු දෙනමට නිග්‍රහකොට බුද්ධවචනය-ඡන්දසට නොනැගිය යුතු බවත් එසේ කරන්නේ නම් දුකුලා ඇවැත් බවත්, බුද්ධවචනය සකාය නිරුක්තියෙන් හදාළ යුතු බවත් දැක්වූහ.[13] සකාය නිරුක්ති යන්නට මාගධී ව්‍යවහාරයයැයි (භාෂාව) අටුවාවේ සඳහන්ව ඇත.[14] අටුවාකරු එසේ පැවසුවද සකාය නිරුක්ති යන වචනයෙන් බුදුන් අදහස්කළේ ඒ ඒ දේශීය භාෂාවන් විය යුතුය. බුදුන් විවිධ දේශීය භාෂාවලින් බුද්ධවචනය හැදෑරීමට අනුබල දුන් බව චුල්ලවග්ගපාඨයෙන් පැහැදිලිය. ථෙරවාදීන් පාලිය භාෂා මාධ්‍යය වශයෙන් යොදාගත් අතර සර්වාස්තිවාදීන් සංස්කෘතයද මහාසාංඝිකයන් ප්‍රාකෘතය ද සම්මිතීයයන් අපභ්‍රංශයද පූර්වශෛල අපරශෛල නිකායිකයෝ ප්‍රාකෘත ව්‍යවහාර කළෝය. බොධ දූතයෝ වැඩම කළ ඒ ඒ රටවල පැවති ව්‍යවහාර භාෂා ඉගැන්වීමේ මාධ්‍යය වශයෙන් යොදාගත්තෝය.

---

9. මහාවංසො-පරි.14 ගා.65"ධම්මං භාසිත්ථ දීප භාසාය වත්ත"
10. සමන්තපාසාදිකාව-පිට 1 (ගුලුරුවේ මහාවිහාර පඤ්ඤාලොකාභිධ මහතෙර සංස්: බු.ව.2460)
11. ධම්පියාඅටුවාගැටපදය - පිට·5-6(මැදඋයන්ගොඩ විමලකිත්ති සංස්:1960)
12. චුල්ලවග්ගපාලි -පිට218 (සිරිපාද ත්‍රිපිටක ග්‍රන්ථමාලා _ 12)
13. "අනුජානාමි භික්ඛවෙ සකාය නිරුත්තියා බුද්ධවචනං පරියාපුණිතුං" (චුල්ලවග්ගපාලි)
14. "සකාය නිරුත්තියාති එත්ථ සකානිරුත්ති නාම සම්මාසම්බුද්ධෙන වුත්තප්පකාරො මාගධිකො වොහාරො" (සමන්තපාසාදිකාව පිට-306 -චුල්ලවග්ගවණ්ණනා)

මහින්ද ස්ථවිරයන්වහන්සේ ද එකල ලංකාවේ ව්‍යවහාරව පැවතුන භාෂාව අධ්‍යාපන මාධ්‍යය වශයෙන් යොදාගත් බව පෙනේ. මව් භාෂාවෙන් ඉගැන්වීමේ වැදගත්කම ගැන අවධාරණය කරන වර්තමාන අධ්‍යාපන විශාරදයන්ගේ මතවලින් මහින්ද ස්ථවිරයන්වහන්සේ අනුගමනය කල ප්‍රතිපත්තියෙහි ගුණාන්විත භාවය මොනවට පැහැදිලි වෙයි.

මහින්දස්ථවිරයන්වහන්සේ අනුගමනය කල අධ්‍යාපනික ප්‍රතිපත්තිය සමන්තපාසාදිකාවෙහි ඇතුලත් දෙවනපැතිස් හා මිහිඳු හිමියන් අතර කෙරුණු සාකච්ඡාවකින් තවදුරටත් පැහැදිලි වෙයි. 15

රජතුමා :- ස්වාමිනි, තම්බපණ්ණි දිපයෙහි බුධශාසනය පිහිටියේද?

මිහිඳුහිමි:- මහරජ, බුධශාසනය පිහිටියෙහිය. එහෙත් තාම මුල්බැසගත්තේ නැත.

රජතුමා :- කවදා එහි මුල්බැස ගන්නේද?

මිහිඳුහිමි:- යම්කලෙක මහරජ, තම්බපණ්ණිදිපයෙහි මව්පියන්ට ජාතක වූ දරුවෙක් තම්බපණ්ණිදිපයෙහිම පැවිදිව තම්බපණ්ණිදිපයෙහිම විනය ඉගෙන තම්බපණ්ණිදිපයෙහිදීම උගන්වන්නේද එකල බුධශාසනය මුල්බැසගනී.

රජතුමා :- එවැනි භික්ෂුවක් සිටින්නේද? ස්වාමිනි,

මිහිඳුහිමි:- ඇත.මහරජ අරිට්ඨ භික්ෂුව මේ කටයුත්තෙහි සමත්ය.

රජතුමා :- මා විසින් කුමක් කල යුතුද? ස්වාමිනි

මිහිඳු හිමි:- නුඹ විසින් මණ්ඩපයක් කිරීම සුදුසුය.

රජතුමා ථූපාරාමයේ මණ්ඩපයක් ඉදි කළේය. අටසැට දහසක් භික්ෂූන්වහන්සේලා එකල ථූපාරාමයේ රැස්වූහ. දකුණුදිගට මුහුණ ලා මිහිඳු තෙරුන්ගේ ආසනය පනවන ලදී. මහාරිට්ඨ තෙරුන් සඳහා උතුරට මුහුණ ලා ආසනයක් පනවන ලදි. මිහිඳු තෙරුන් විසින් ආරාධනා කරනු ලැබූ මහාරිට්ඨ තෙරුන් සුදුසු ලෙස ක්‍රමයෙන් පැමිණ ධර්මාසනයේ වැඩ හුන්හ්ය. සෙසු භික්ෂූන්වහන්සේලා සහ රජු සහිත පිරිස ද පනවන ලද අසුන්වල වැඩිහුන. අනතුරුව මහාරිට්ඨ තෙරුන්වහන්සේ විනය සංගායනා කළේය.

---

15. සමන්තපාසාදිකාව පිට 50 (බාහිරනිදාන වණ්ණනා)
"යදා මහාරාජ,තම්බපණ්ණිදිපකානං මාතාපිතූනං තම්බපණ්ණිදිපෙ ජාතො දාරකො තම්බපණ්ණිදිපෙ පබ්බජිත්වා තම්බපණ්ණිදිපස්සෙව ආචරියස්ස සන්තිකෙ විනයං උග්ගහෙත්වා තම්බපණ්ණිදිපෙ වාචෙස්සති.තදා සාසනස්ස මූලානි ඔතිණ්ණානි නාම භවිස්සන්ති"

ඉතා ඉක්මනින් ලාංකික භික්ෂු භික්ෂුණීන්වහන්සේලා උගතුන්කොට ආරාම අධ්‍යාපන සංවිධානයේ ප්‍රධානත්වය උන්වහන්සේලා අතට පත්කිරීමට මහින්දස්ථවිරයන්වහන්සේ ක්‍රියා කළේය. මිහිඳු හිමියන් ථූපාරාම විනය සංගායනාවේ ප්‍රධානත්වය ගන්නා ලෙස මහාරිට්ඨ තෙරුන්ට ආරාධනා කළේය. මිහිඳුහිමියන්ගේ ජීවිතකාලය තුළදීම උසස් ලාංකික භික්ෂු පරපුරක් ආරාම අධ්‍යාපනය පවත්වාගෙන යාම සඳහා පුරුපුරුදු කෙරිණි. ලාංකික භික්ෂුවක් විසින් අනින් ලාංකික භික්ෂුන්ට පෙළ දහම සහ අර්ථකථා උගන්වනු සියැසින් දැක උන්වහන්සේගේ සිය පරිශ්‍රමය ගැන ඉමහත් සතුටට පත්වන්නට ඇත. මෙසේ ධම් දූතයෝ සවිධිසි ව්‍යාපාරයක චිරස්ථිතිය එම ව්‍යාපාරය පිළිබඳ ලබාදෙන අධ්‍යාපනය මත රඳා පවතින බව විශ්වාස කළේය. ආරාම අධ්‍යාපනය පිළිබඳ ඉතිහාසයේ මෙය ඉතා වැදගත් කරුණකි. ලංකාවේ බුද්ධශාසනය මුල්බැසගැනීම පිළිබඳව මිහිඳු හිමියන් කළ ප්‍රකාශනය මෙම මතය අපට පැහැදිලි කරවයි. කලයොයට ආදී සංඝකර්ම පිණිස බුද්ධාගමෙන් මෙහි සීමාවක් බැන්ද කල්හි ශාසනය පිහිටන්නේයයි මිහිඳු හිමියන් පැවසූ බව මහාවංශයේ සඳහන් වෙයි.[16] සමන්තපාසාදිකාවේ දැක්වෙන හැටියට ලංකාවේ බුද්ධශාසනය පිහිටිනමුත් එය මුල්බැස ගන්නේ ලාංකික භික්ෂුන්වහන්සේ නමක් විනය හදාරා ලංකාවේදී විනය සංගායනා කිරීමට සමත් තත්වයකට පත්වමෙනි. සමන්තපාසාදිකාවේ දැක්වෙන්නේ යථෝක්ත මහාවංශ අදහසට වඩා වෙනස් අදහසකැයි සමහරු කල්පනා කරති."සමන්තපාසාදිකාවේ එන නියමන දීපවංශයෙහි සහ මහාවංශයෙහි එන නියමනට වඩා ව්‍යඤ්ජන වශයෙන් වෙනස් වුවත් ඒ දෙකම අර්ථය අතින් එකිනෙකට එකඟය. සංඝකර්මයන්හිදී විනය සංගායනාව අවශ්‍යමය. සංඝකර්මයන්ට සීමාවක් අවශ්‍යමය. සංඝයා ඉදිරි යති (මහාරිට්ඨ ස්ථවිරයන් විසින්) විනය සංගායනා කිරීම සංඝකර්මයක් හා සමානය. මෙසේ ගැනෙන විට ශාසනයේ පිහිටීම අන්තිමේදී සංඝයා පිහිටවීමක් බවට පෙරලේ. ඉතින් සීමාවක් හා විනය සංගායනාවක් නැතිව සංඝයා පිහිටුවීමක් කොතළ හැකි"යයි ආචාර්ය වල්පොල රාහුල හිමි පවසයි.[17] මහාවංශයේ සහ විනයට්ඨකථාවේ සඳහන් වන්නේ එකිනෙකට වෙනස් පිළිතුරු දෙකක් බවත්,එය එකක් සේ උන්වහන්සේගේ වචනයෙන විවේචනය කර ඇති බවත් සැලකිය නොහැකිද?

---

16. මහාවංශය - පිටු-46 පරි.15 ගා.180 - 181
17. ලංකාවේ බුදුසමයේ ඉතිහාසය - පිට 67

මහාවංශයේ දැක්වෙන පරිදි මෙය චිත්‍රයට සිතුවම් ශිල්පයෙන් පූජනීයත්වය විය. තිස්සමහාරාමයේ විහාරයෙහිදී සිතුවම් ඇඳ තිබූ වර්ණවත් පූජාසනය මෙම ශෛල චිත්‍ර කලාව වර්ධනය කිරීමට පෙළඹවීමක් ඇත. සිංහල බෞද්ධයෝ පූජාසනය චිත්‍ර කලාව වර්ණවත් කිරීමේදී රන් රිදී ආදිය පමණක් නොව පූජනීය මෙම චිත්‍රය ශෛලමය කළේ, මිහින්තලයේ සඳහන් විහාරයේදී දක්වන්නේ වර්ණය ඇත්තේ.

දුටුගැමුණු රජතුමාගේ පසු රුවන්වැලි ස්තූපයේ ධාතුගර්භය සඳහා කරවූ කලේය. ස්තූපයේ චිත්‍රය සඳහා කළ ලද කරවූ ආරාම අධ්‍යක්ෂයේ චිත්‍රය සඳහා යොදා වූ මේ අනුශාසක නියමුවනොවේ. ආරාම විශාල සංඛ්‍යාවක්[18] දීපවංශය පරිදි ගොඩනැගීමෙන් පසුවිඳින්නේ විශාල චිත්‍රය ශිල්පී ශිල්පීන් සමහරක් ඇල්ලෙව් ප්‍රතිමා චිත්‍ර සිත් පමණ ලෙසමෙම චිත්‍ර ශිල්පීන් විසින් සිදුකර පූජා නැතුව පැල්මට උපදෙස් වන්නේය. මෙම ඉතිහාසය කිව වැනි ලුවිට කාලයන්ගේ කාලමල අනුරාධපුර රාජධානියේ ආරාමවල අභ්‍යන්තර චිත්‍රයන් ඇති බොහෝ කළින් මෙය සහ රෝහණයේ මෙන් කාලයන්ගේ අනුශාසනයෙන් එම ප්‍රදේශවල සිදු කළමන චිත්‍රය පැවති බවත් ආරාම අධ්‍යක්ෂක අනන්ත ඇතුළු වත් කළේය චිත්‍ර කරවූ ඇත.[19] දුටුගැමුණු රජතුමාගේ කාලයේ ( ) ස්තූපයට ලැබුණු අනුපම අනුශාසක ආරාම අධ්‍යක්ෂයේ චිත්‍රයට යෙදවූ බවට සිතීම පැහැදිලි ඇත. මෙකල ඉදිකෙරුණු ගොඩනැගිලි අතර ලෝවාමහාපාය අත්‍යන්තර පැවතුණ විශාල මැඳකත් ගොඩනැගිල්ලක් විය. මෙම දෙවෙනි මාලයෙහි ත්‍රිපිටකධර භික්ෂු විසුහ.[20] ගෙනේ මෙතෙර විසු භික්ෂුන්වහන්සේලා වර්ණයට දෙවරක් ලෝවාමහාපායට ඇවිට යෙලු දකම හා අර්ථකථාවන් ප්‍රගුණ කළ බවත් ඇවලු නැත් හා සැප නැත් සිතුවම් කළ බවත් දීඝනිකායට්ඨකථාවේ සඳහන්වේ.[21] ලෝවාමහාපායේදී පැවැත්වූ උපෝසථය පිළිබඳ විවර අවස්ථාව ලැබේ. උසින් ලොහපායට පිහිටකොට විසු අභිලේඛන හා ආපාමිකාය මණ්ඩල යන කවිවලින් ඇඳිස්සූ ගැලපු දෙකකට ගස්සුන. දුටුගැමුණුගේ කාලයේදී උගත් ශ්‍රේෂ්ඨ ශිල්පීයන් බොහෝ දෙනෙකු[22] පැලවීම මෙකල ආරාම අධ්‍යක්ෂයේ චිත්‍රයේ ප්‍රභිටල විශේෂ පැලවීමට පුළුවන.

18. මහාවංශය -පරි 21 ගා.7
19. ථූපවංශය - පිට 31 (ඩී.ඇම්.සමරසිංහ සංස්කරණය) 1940
    මහාවංශය -පරි 22 ගා.11-23
20. මහාවංශය - පරි.27 ගා.44
21. දීඝනිකායට්ඨකථාව - පිට 406 (හ.සේ.මු.-1918)
22. පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය. පිට. 156.

ආමිස දානයට වඩා ධර්ම දානය ( ධර්මය කියාදීම හා ඉගැන්වීම) උසස් කොට සැලකූහ. ආරාම අධ්‍යාපනය දියුණු කිරීම සඳහා දුටුගැමුණු රජතුමා ක්‍රියා කළේය. ඔහු දිවයින පුරා ධර්මදේශකයන් හට සත්කාර කොට ධර්මදේශනා කරවිය. එක් එක් ධර්මපීඨ නමකට ගිතෙල් සහ සකුරු නැළිය බැගින් ද සතරඟුල් දිග වැල්මී කැලි මිටක් බැගින්ද වස්ත්‍ර දෙකක් බැගින් ද දෙවි යැයි මහාවංශයේ සඳහන් වෙයි.[23] එකි එකි ධර්මශාලාවල අනඝි වූ වියනක් ධර්මාසනයක් ඇතිරිල්ලක් දණ්ඩාසනයක් බණවස්නක් කබලියක් විජිනිපතක් බණපොතක් බැගින් ලැවි යැයි පූජාවලියේ සඳහන් වෙයි.[24]

ලංකාවේ ආරාම අධ්‍යාපනික ඉතිහාසයේ යම් යම් වෙනස්කම් ඇති වූ කාල පරිච්ඡේදයක් වශයෙන් වලගම්බා සමය ඉතා වැදගත් කොට සැලකිය හැක. මෙම කාලයේ උදාවූ අහිතකර දේශපාලන තත්වයත් ආර්ථික පරිහානියත් නිසා ආරාම අධ්‍යාපනය මුලුමනින්ම වාගේ එක්තරා කලකට පිරිහී පැවතුනි. වලගම්බා පරාජයට පත්වීමෙන් පසු වර්ෂ දාහතරක කාලයක් (ක්‍රි: පූ: 103 –89) ද්‍රවිඩයෝ අනුරාධපුරයේ පාලන බලය අල්ලාගෙන සිටි බව මහාවංශයෙන් හෙළිවෙයි.[25] මෙම ද්‍රවිඩ පාලකයන් පිළිබඳ කිසිත් සඳහන් නොවන අඨකථා වලින් හෙළිවන්නේ බෞද්ධ විරෝධියෙකු වූ තිය බ්‍රාහ්මණයා. දොළොස්වසරක් පමණ කාලයක් බලය අල්ලාගෙන සිටි බවයි.[26] ද්‍රවිඩ ආක්‍රමණයත් තිය බ්‍රාහ්මණයාගේ කැරැල්ලත් එකිනෙකට සම්බන්ධ සිද්ධි දෙකක් වශයෙන් පරණවිතාන මහතා අදහස කරයි.[27] බ්‍රාහ්මණතිස්ස සාගතය නමින් අඨකථාවල සඳහන් වන සාගතය පිළිබඳ විස්තර සලකා බැලීමෙන් මෙකල ඇතිවූ ආර්ථික පරිහානිය ආරාම අධ්‍යාපනයේ පරිහානියට කෙතෙක් හේතුවි දැයි නිගමනය කල හැක.[28]

---

23. මහාවංසො පරි.32 ගා. 42 – 46
24. පූජාවලිය පිට 772 ,73 (කිරිඇල්ලේ ඥාණවිමල සංස්කරණය 1952)
25. මහාවංසො පරි.33 ගා.39– 63
26. විභඞ්ගට්ඨකථාව පිට.314 (ස.හේ.මු.1932)
27. ලංකා ඉතිහාසය [illegible] (විද්‍යාලංකාර පරිවර්තනය) පළවෙනි කාණ්ඩය 1 කොටස [illegible]
පිට 163.
28. රසවාහිනී(වත්තුලපබ්බතසො වත්ථු, අභයථෙර වත්ථු, ) – විභඞ්ගට්ඨකථාව පිටු 314 – දීඝනිකායට්ඨකථාව පිට.369 – මජ්ඣිමනිකායට්ඨකථාව පිට.331,32 (ස.හෙ.මු. 11 )

මෙවැනි දේශපාලනික ආර්ථික වශයෙන් අයහපත් කාලයක ආරාම අධ්‍යාපනය සම්පූර්ණයෙන් විනාශවී යාම වලකනු සඳහා භික්ෂූන්වහන්සේලා ගත් ක්‍රියා මාර්ග කවරේද? ලංකාවේ ජීවත්වීමට මගක් නොතිබූ හෙයින් එතෙක් කටපාඩමින් පවත්වාගෙන ආ පර්යාප්තිය හෙවත් ත්‍රිපිටකය සහිත අර්ථකථාව ඉදිරියටත් රැකගැන්ම සඳහා පහුරු බැඳ ඒ මත නැගී බොහෝ භික්ෂූන්වහන්සේලා එතරට වැඩම කළෝය. මහ සැඩ සයුර තරණය කළ ඒ බියකරු අවස්ථාවේ පවා මෙම භික්ෂූන්වහන්සේලා ශාස්ත්‍රීය කටයුතු අමතක නොකළෝය. දැනට දක්නට නොමැති පච්චරිය අට්ඨකථාව සමුද්‍ර තරණයේදී පහුරමත සිටි භික්ෂූන්වහන්සේලා විසින් රචනා කරන ලද්දක් හැටියට විශ්වාසයක් පවතී. මුහුදු තෙරට පැමිණ එතෙර යෑමේ අදහස අත්හැර දැමූ සැටක් පමණ භික්ෂූන්වහන්සේලා මලය රටට වැද අල මුල් ආහාර කොට ගනිමින් ත්‍රිපිටකය අමතක වන්නට ඉඩ නොතබා සජ්ඣායනා කළෝය. සාගතය අවසානයේදී එතෙර වැඩි භික්ෂූන්වහන්සේලා ලංකාවට පැමිණ කලේ ලංකාවේ සාගත කාලයේ නතරව සිටි භික්ෂූන් වහන්සේලාත් සමග ත්‍රිපිටක ධර්මය සසඳා බැලීමයි. ප්‍රත්‍යය දුර්ලභත්වයෙන් ක්ලාන්තව ලංකාවේ විසූ භික්ෂූන්වහන්සේලා එක අකුරකුදු නොවෙනස්ව ත්‍රිපිටක ධර්මය ධාරණය කරගෙන සිටිබව එහිදී පැහැදිලි විය.[29] ඇතැම් භික්ෂූන්වහන්සේලා ආරාම වල්බිහිව විනාශවියාමට අකමැත්තෙන් ජීවිතය ගැනද නොතකා ආරාමවලට වී ජීවත්වූහ.[30] දුශ්ශීල චරිතයක් ඇති භික්ෂුවකගෙන් මහානිද්දේසය ඉගෙන ගැනීමට මහාරක්ඛිත තෙරුන්වහන්සේ ඉතාම අකමැත්තෙන් ඉදිරිපත්වූයේ එම ග්‍රන්ථය සම්පූර්ණයෙන් විනාශවී යාමට ඉඩතිබුණු නිසාය. ත්‍රිපිටක ධර්මයත් අර්ථකථාවත් අමතක නොකර හදාරණ ලෙස භාරත ගම්වැසියන් රහසින් පලාගිය අවස්ථාවේදී එම ගම විසූ නාගා නම් වූ ගණප්‍රධාන තෙරණිය අනෙක් භික්ෂුණීන්වහන්සේලාට අවවාද කළාය.[31] ආරාමවල ඉගෙනගත් ප්‍රධාන විෂය වන පර්යාප්තිය ආරක්ෂාකර ගැනීම සඳහා මෙකල විසූ භික්ෂු භික්ෂුණීන්වහන්සේලා ගත් උත්සාහය ප්‍රශංසනීයය.

---

29. අඞ්ගුත්තරනිකායට්ඨකථාව පිට. 52 (ස.හේ.මු.1923)
30. රසවාහිනී (අභයතෙර වතු) [illegible]
31. දීඝනිකායට්ඨකථාව පිට 369 [illegible] මජ්ඣිමනිකායට්ඨකථාව (II) පිට.331,32

බැමිණිතියා සාගතය අවසානවීමෙන් පසු කල්ලගාම ජනපදයේ මණ්ඩලාරාම විහාරයෙහි පැවැත්වූ භික්ෂු සමාගමෙහිදී පංශුකූලික සහ ධර්මකථික භික්ෂු ගණදෙක අතර සිදුවූ විවාදය අවසානයේදී ගනු ලැබූ තීරණය ආරාම අධ්‍යාපනයෙහි දියුණුවට බෙහෙවින් හේතු විය. සාසනයට මුල්වන්නේ පර්යාප්තියද එසේ නැතහොත් ප්‍රතිපත්තිය ද යන විවාදය මෙකී භික්ෂු සමාගමෙහිදී මතුවිය.[32] ප්‍රතිපත්තිය ශාසනයට මුල්වන්නේ යයි පංශුකූලිකයෝ කීහ. උන්වහන්සේලා සිය මතය තහවුරු කරනු පිණිස පෙල දහමින් හේතූන් ද ඉදිරිපත් කළෝය. "සුභද්‍ර මේ භික්ෂූහු මැනවින් වාසය කරන්නාහු නම් ලෝකය රහතුන්ගෙන් හිස් නොවන්නේය". "මහරජ මේ ශාසන ශාසනය ප්‍රතිපත්තිය මුල්කොට ඇත්තේය. ප්‍රතිපත්තිය සාරය සාර කොට ඇත්තේය. ප්‍රතිපත්තිය ධාරණය කොට ඇත්තේය." එහෙත් පංශුකූලිකයන්ගේ මෙකී හේතූන් බිඳහෙලීමට සමත් තර්ක මතුකොට දැක්වීමට ධර්මකථිකයෝ සමත්වූහ. "සූර්යයා නැගී කල්හි ආලෝකය දක්නා මෙන් සූත්‍රාන්තයන් ඇති කල්හි විනය බබලන්නේය. සූර්යයා අස්තංගතවූ ලෝකයෙහි අඳුර වන්නේය. එසේම සූත්‍රාන්තයන් නොමැති කල්හි විනයෙහි ද මුලාවන්නේය." "සූත්‍රාන්තයන් රැකුන කල්හි ප්‍රතිපත්තිය රැකුනේ වෙයි. ප්‍රතිපත්තියෙහි සිටි ධ්‍යානවන්ත තෙම නිර්වාණයෙන් නොපිරිහෙන්නේය." "ආරබ්ධ විදර්ශක වූ භික්ෂූන් සියක් දහසක් ඇතත් පරියාප්තිය නොමැති කල්හි ආර්යමාර්ග ප්‍රතිවේධයක් නම් නැත." පරියාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවේධ යනු ත්‍රිවිධ ශාසනයයි. ධර්මකථික භික්ෂූන්වහන්සේලා ප්‍රතිවේධ ශාසනයට මුල පර්යාප්තියයි සැලකූහ. උන්වහන්සේලා ප්‍රතිපත්තියට වඩා ත්‍රිපිටකය සහිත අර්ථකථාව ඉගෙනීම සහ ඉගැන්වීම උසස්කොට සැලකූහ. මෙම විවාදය අවසානයේදී පර්යාප්තිය ශාසනයට මුල්වන්නේය යන මතය සම්මත විය.[33] මේ නිසා ආරාම අධ්‍යාපනය එතෙක් නොලද නව ප්‍රබෝධයක් ලබා මෙතැන්සිට දියුණුවන්නට ඇත. පංශුකූලිකයෝ විනය පිටකයද ද ධර්මකථිකයෝ සූත්‍ර පිටකය ද ප්‍රධානත්වයේලා සැලකූහ.

---

32. "පරියත්ති නු බො සාසනස්ස මූලං උදාහු පටිපත්ති"ති – අඞ්ගුත්තර නිකායට්ඨකථාව පි.52,53

33. අඞ්ගුත්තර නිකායට්ඨකථාව – 52,53 පිට.

34. මහාවංසය, පරි. 33. ගා. 102-103.

වලගම්බා සමයේදී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම[34] ආරාම අධ්‍යාපනයේ වෙනස්කම් කිපයක් ඇතිකිරීමට හේතුවිය. මේ පිළිබඳව පසුව කරුණු සාකච්ඡා කරමු.

වලගම්බා කාලයේදී අභයගිරි නම්වූ නව බෞද්ධ ගුරුකුලයක ආරම්භය 35 ආරාම අධ්‍යාපනය පිළිබඳ ඉතිහාසයේ තවත් වැදගත් සිදුවීමකි. මහාවිහාරය ථෙරවාදී බෞද්ධ ගුරුකලයට අයත් අධ්‍යාපනික මධ්‍යස්ථානය විය. දිවයින පුරා විසිරී පැවතුණු අනෙක් ථෙරවාදී ආරාම මහාවිහාරයට අනුබද්ධ විය. එහෙත් මෙකල ගොඩනැගුණු අභයගිරිය මහාවිහාරයට අනුබද්ධ වූ ආරාමයක් නොවිය. අභයගිරිය මධ්‍යස්ථානය කරගත් මහාවිහාර හා මහායාන සම්ප්‍රදායට බර ආරාමයන් ද මින් පසු දිවයින පුරා ගොඩනැගුණි. මහාවිහාර අභයගිරි ආයතනවල පැවති අධ්‍යාපන ක්‍රමය බෙහෙවින් සමාන වන්නට ඇති නමුත් මෙම ආයතන දෙකේ උගැන්වූ විෂය මාලාව වැනි කරුණු අතින් යම් යම් වෙනස්කම් ද දක්නට ලැබේ. මහාවිහාර වාසීන් හීනයානය පමණක් උගත් බවත් අභයගිරි වාසීන් මහායාන හීනයානද්වයම උගත් බවත් හියුංසාං සඳහන් කරයි.36 අභයගිරිකයෝ සංස්කෘත භාෂාවද හදාලෝය. මහාවිහාරය සහ අභයගිරිය යන ආයතන දෙක අතර නොයෙක් අවස්ථාවල ඇතිවූ වාද විවාද ආරාම අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි නොයෙක් ප්‍රතිවිපාක ඇතිකල බව පසුකාලයෙහි ඉතිහාසය විමසා බැලීමෙන් පැහැදිලි වෙයි.

ක්‍රි:ව: 1 වෙනි ශතවර්ෂය වනවිට ආරාම ජීවිතයේ ධුර ධුර භේදය (ග්‍රන්ථධුර විදර්ශනා ධුර) ස්ථිර වශයෙන් පහලව තිබූ බව කිව හැක. භාතිකාභය රජතුමා (ක්‍රි:පූ:22 ක්‍රි:ව:7) ග්‍රන්ථධුරයෙහි (අධ්‍යාපනික කටයුතුවල) නියුක්ත භික්ෂූන් වහන්සේලාට ප්‍රත්‍යයෙන් සංග්‍රහ කළ බව මහාවංශයෙහි සඳහන් වෙයි.[37] ආරාමවල හෝ වනගතව විසූ විදර්ශනාධුරික භික්ෂූන්වහන්සේලා භාවනානුයෝගී ජීවිතයක් ගතකලෝය. ග්‍රන්ථධුරික භික්ෂූන්වහන්සේලා ආරාමවල වාසයකරමින් ඉගෙනීමේ සහ ඉගැන්වීමේ කටයුතුවල නිරත වූවෝය.

---

35. මහාවංසො පරි.33 ගා. 80- 84
36. හියුංසාං භ්‍රමණ වෘත්තාන්තය පිට.321 (පො.බුද්ධදත්ත හිමියන්ගේ සිංහල අනුවාදය)
37. මහාවංසො පරි:34 ගා.66

"තමාගේ නුවණ පමණට එක නිකායක් හෝ දෙනිකායක් හෝ සියලුම ත්‍රිපිටක බුද්ධ වචනය හෝ ඉගෙන එය ධාරණය කථනය වාචනය ගන්ථධුරය යයි ධම්මපදට්ඨකථාවේ සඳහන්වෙයි.[38] මෙසේ ආරාම ජීවිතයේ අධ්‍යාපනික අංගයක් විශාලකොටස්වීම වැදගත්කොට සැලකියහැක. පසුව විදර්ශනාධුරයට වඩා ග්‍රන්ථධුරය උසස්කොට සැලකීම ආරාම අධ්‍යාපනයේ උන්නතියට හේතුවිය. ශාසනයේ චිරස්ථිතියට මූලිකවන්නේ ප්‍රතිපත්තියට වඩා පර්යාප්තිය යයි යන මතය වළගම්බා කල සම්මුතිය ලැබීම ආරාමවල භාවනානුයෝගී ජීවිතයට වඩා අධ්‍යාපනික කටයුතුවල යෙදීම උසස්කොට සැලකීමට හේතුවිය. ආරාමවල අධ්‍යාපනික කටයුතුවල නිරතවූ භික්ෂූන්ට රජුන් විසින් කැරුණු සංග්‍රහ ගැන මහාවංශයේ සඳහන් වෙයි. වසභ රජතුමා (ක්‍රි:ව:67-111) ග්‍රන්ථධුරයෙහි යෙදුණු භික්ෂූන්ට ප්‍රත්‍යය සැලසුවේය. එමෙන්ම ධම්මකථික භික්ෂූන්ට (ධර්මය උගැන්වූ භික්ෂූන්ට) තිතෙල් හා උක්සකුරු දුන්නේය.[39]

මහසෙන් රජුගේ කාලයේ(ක්‍රි:ව: 247-301) ආරාම අධ්‍යාපනය ගැන සඳහන් කළ යුතු වැදගත් කරුණු ඇත. මෙතෙක් මහාවිහාරය සහ එයට අනුබද්ධ ආරාමවල දියුණුවෙමින් ආ අධ්‍යාපනික කටයුතු කඩාකප්පල්විය. මහාවෙහෙර වැසි මහණෙකුට අහරක් දුන් කෙනෙකුට සියක් දඩ යැයි මහසෙන් විසින් නියෝගයක් නිකුත් කෙරිනි. මහාවෙහෙර වැසියෝ අනුරපුරය හැර [illegible] රුහුණු මලය ප්‍රදේශවලට ගොස් විසුවෝය.[40] මහාවිහාරයට අයත් ගොඩනැගිලි විනාශකොට එහි උඳු වපුරවන ලදී.[41] මේ නිසා මහාවිහාරයේ අධ්‍යාපනික කටයුතු එකෙමපිටින්ම විනාශයට පත්විය. එහෙත් රෝහණය වැනි ප්‍රදේශවල ථෙරවාදී ආරාමයන්හි අධ්‍යාපනික කටයුතු අඛණ්ඩව පැවතුනි. රෝහණය මුලපිටම ථෙරවාදී අධ්‍යාපනික කටයුතුවලට හිතකර පරිසරයක් පැවතුනි.

---

38. ධම්මපදට්ඨකථාව - පිට 4 (ස.හේ.මු.-1919)
39. මහාවංශය - පරි.35 ගා.92-93
40. මහාවංශය - පරි.37 ගා. 7
41. නිකායසංග්‍රහය - පිට 11(මුනිදාස කුමාරණතුංග සංස්කරණය)

CR
ලංකා
ශාලාව

මහාවිහාර ගුරුකුලයට ප්‍රතිපක්ෂ වූ අභයගිරි ගුරුකුලය මහසෙන් රජතුමාගේ කාලයේදී මෙතෙක් නොලද දියුණුවක් ලැබුවේය. අනුරාධපුරයේ අභයගිරියෙහි සහ එයට අනුබද්ධ ආරාමයන්හි අධ්‍යාපනික කටයුතු පෙර නොලද රාජ්‍ය අනුග්‍රහයක් ලැබ දියුණු වූ ලෙස සිතිමට පුළුවනක. එතෙක් මහාවිහාර වාසීන්ගේ ආයතනයන් ලෙස පැවති සමහර ආරාමයන්ද අභයගිරිකයන් සතු වී ඔවුන්ගේ අධ්‍යාපනික කටයුතුවල මහායාන ධර්ම මධ්‍යස්ථාන බවට පත්විය. "එකල අභයගිරිවාසි භික්ෂූහු ගොස් සැඟිරියේ පදංචි වූහ." යි මහාවංශයේ සඳහන් වේ. 42 වෙතයගිරියෙන් ලැබෙන පසුකාලයට අයත් ලිපිවලින් එහි මහායාන අධ්‍යාපනය පැතිරිතිබුණු බව පැහැදිලි වෙයි. 43

මහසෙන් රජතුමා විසින් මෙකල ගොඩනගන ලද ජේතවනාරාමය ලංකාවේ ආරාම අධ්‍යාපනික ඉතිහාසයේ ඇති වූ තෙවෙනි ගුරුකුලයේ මධ්‍යස්ථානය විය. ජේතවනය , මහාවිහාරයට හෝ අභයගිරියට හෝ අනුබද්ධ නොවී අධ්‍යාපනික කටයුතු අතින් ස්වාධීනත්වයක් ඉසුලුවේයයි නිගමනය කළ හැක. පොදුවේ ගත්විට ජේතවනයේ පැවතුණේද මහාවිහාරයේ සහ අභයගිරියේ පැවතුනු බෞද්ධ අධ්‍යාපන ක්‍රමයයි. එහෙත් ආරාම අධ්‍යාපනයේ ප්‍රධාන විෂය වූ ත්‍රිපිටකය ඉගැන්වීමෙහිදී මහාවිහාර අභයගිරි ආයතන දෙකට වඩා ජේතවනිකයෝ වෙනස් මගක් ගෙන ව්‍යාඛ්‍යාන කළෝය.[44] නව වසරකට පසු මහාවිහාර විරෝධී ප්‍රතිපත්තිය මහසෙන් රජුට අතහැරීමට සිදුවිය. මේ නිසා මහාවිහාරිකයෝ අනුරාධපුරයට යළි පැමිණියෝය.

---

42. මහාවංසො පරි. 38 ගා. 75,76

43. ත්‍රිකායස්තව ලිපිය: ( (Epigraphia Zeylanica vol.iv.p.242/46)
~~(ත්‍රිකායස්තව ලිපිය)~~ පඤ්චවිංසතිසාහස්‍රිකා ප්‍රඥාපාරමිතා නම් මහායාන ග්‍රන්ථයේ කොටස් ලියා ඇති ඉදිකටු සෑයෙන් ලැබෙන තඹ තහඩු හතළිස (E.Z.vol.iii.p.1⁹9-212
එහිම ලැබෙන තවත් තඹ තහඩු පහළවක පමණ කාශ්‍යප පරිවර්තනය නම් ග්‍රන්ථයෙන් උපුටාගත් කොටස් ලියා ඇත. (E.Z.vol.iv.p.238 - 4D)

44. ~~නිකාය සංග්‍රහය පිට 11 (මුනිදාස කුමාරණතුංග සංස්කරණය)~~
මහාවංස ටීකාව. පිට. 115-116.

නැවතත් මහාවිහාරයේ සහ තදනුබද්ධ අනිත් ආරාමයන්හි ද අධ්‍යාපනික කටයුතු ආරම්භ කෙරුණු නමුත් යථා තත්වයට පත්වන්නට ඇත්තේ සිරිමෙඝවන් රජතුමාගේ කාලයේදී විය යුතුය. 45

බුද්ධදාස රජතුමා ( ———————— ) ආරාම අධ්‍යාපනය දියුණුකිරීම සඳහා උනන්දුවූ පාලකයෙකි. ධර්මභාණකයන්ට සත්කාර කොට ධර්මය ඉගෙනීමට කටයුතු යෙදුවේය. ධර්මභාණකයන්ට (ධර්මය උගැන්වූවන්ට) වැටුප් ද දුන්නේය.[46] ධර්මදේශනා කළ භික්ෂූන්ට භත් භෝගයන් සහ කැපකරුවන් ද දුන්නේය.47 "බුජස්රජ ලක්දිව.... ගමකට බණකියන පණ්ඩිතයෙකු බැගින් ඉඳුවා බොහෝ දිනවල සෑම ගම්වල බණකියවූ බව රාජාවලියේ සහ රාජරත්නාකරයේ ද සඳහන් වෙයි.[48] ආරාමවල ඉගෙන ගත් ප්‍රධාන විෂය වූයේ පෙළ දහම සහ එහි අර්ථකථාව බව මුලදී සඳහන් කළෙමු. පෙලදහම මාගධී භාෂාවෙන් ඉගැන්වීමත් එහි අර්ථ කථාව සිංහල භාෂාවෙන් ඉගැන්වීමත් දෙවනපෑතිස් සමයේ සිට මෙතෙක් අනුගමනය කෙරුණු සම්ප්‍රදායයි. එහෙත් මේ කාලයේදී ආරාමයන්හි අර්ථකථාව පමණක් නොව පෙල දහම ද සිංහලෙන් ඉගැන්වීමට උත්සාහ ගත් බව ධර්මකථික හිමියන් විසින් සූත්‍ර පිටකය සිංහලට පරිවර්තනය කිරීමෙන් පැහැදිලි වෙයි. 49 එහෙත් මෙම පියවර චිරස්ථායි වූ බවක් නොපෙනේ.

---

45. මහාවංසො පරි.37 ගා.53 – 61
46. මහාවංසො පරි,37 ගා.149
47. මහාවංසො පරි,37 ගා.173
48. රාජාවලිය පිට. 43 (බි.ගුණසේකර රජවාසල මුදලි මන්ත්‍රීගේ සංස්කරණය) 1899
    රාජරත්නාකරය පිට 27.(සයිමන්ද සිල්වා වාසල මුදලිගේ සංස්: 1907)
49. මහාවංසො පරි.37 ගා. 175